# තාක්ෂණ අමාත්‍යාංශය

# පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

# e-NIC ව්‍යාපෘතියේ ඇබෑර්තු

තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියෙහි (ආයෝජනය ඇ. ඩොලර් මිලියන 50 ට ඉහළ හෝ ඊට සමාන හා ඇ. ඩොලර් මිලියන 100 ට නොඅඩු) පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ව්‍යාපාති ගණකාධිකාරී - PS4, වර්ගය - A (තනතුරු - 01)

**රැකියා විස්තරය**

- ➢ ශ්‍රී ලංකා රජයේ ක්‍රියා පටිපාටිවලට අනුකූලවන පරිදි මනා ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය හා නඩත්තු කිරීම.
- ➢ ව්‍යාපෘතියේ සමස්ත අයවැය හා ඇස්තමේන්තු සකස් කිරීම මෙන්ම වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.
- ➢ ව්‍යාපෘතියේ වැටුප් ඇතුළු සියලුම ගෙවීම් වවුචර සකස් කිරීම හා සියලුම සහතික කරන ලද ගෙවීම් සඳහා චෙක්පත් ලිවීම.
- ➢ සේවක අර්ථ සාධක (EPF), සේවක භාරකාර (ETF) සහ උපයන විට ගෙවීම් බදු (PAYE) වාර්තා සකස් කිරීම සහ අදාළ ආයතන වෙත නිසි පරිදි බැර කිරීම.
- ➢ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.
- ➢ බැංකු සැසඳුම් (Bank reconciliations) සකස් කිරීම.
- ➢ ව්‍යාපෘතියේ සියලු මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය හා සම්බන්ධ වෙමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ➢ ව්‍යාපෘතියේ කටයුතු නිසි ලෙස ඉටු කිරීම සහතික විය හැකි පරිදි ව්‍යාපෘති අරමුදල් ප්‍රවාහය කාලීනව පවත්වාගෙන යාම.
- ➢ ව්‍යාපෘතියේ සියලු මූල්‍ය හා ගිණුම්කරණ කටයුතු රජයේ නීති හා රෙගුලාසි අනුව ඉටු කිරීම.
- ➢ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ මූල්‍ය වටපිටාව තුළ රාජකාරී ඉටුකිරීම.
- ➢ රාජකාරී වේලාවන් අභිබවා කටයුතු කිරීමේ හැකියාව.
- ➢ අපේක්ෂිත මට්ටමින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ව්‍යාපෘති කණ්ඩායම සමග කටයුතු කිරීම.

## 02. අභ්‍යන්තර විගණක - PS4, වර්ගය - A (තනතුරු - 01)

**රැකියා විස්තරය**

- ➢ ශ්‍රී ලංකා රජයේ ක්‍රියා පටිපාටිවලට අනුකූලවන පරිදි නිසි මූල්‍ය, විගණන හා පාලන පද්ධතියක් ස්ථාපනය හා නඩත්තු කිරීම.
- ➢ ව්‍යාපෘතියේ කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික වන පරිදි ව්‍යාපෘතියේ විගණන කටයුතු කාලීනව සිදු කිරීම.
- ➢ අභ්‍යන්තර රෙගුලාසි හා ස්ථාපිත පාලන නියමාවලීන් (Control protocol) වලට අනුකූලව ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සහතික කිරීම.
- ➢ අභ්‍යන්තර වාර්තා සඳහා අදාළ විගණන වාර්තා හා ලේඛන සකස් කිරීම.
- ➢ ව්‍යාපෘතියේ විගණන ක්‍රියාපටිපාටි රජයේ නීති හා රෙගුලාසි අනුව ඉටු කිරීම.
- ➢ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ වටපිටාව තුළ රාජකාරී ඉටුකිරීම.
- ➢ ව්‍යාපෘති කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා ව්‍යාපෘති කණ්ඩායම සමග කටයුතු කිරීම.

**තනතුරු 01 හා 02 සඳහා අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද ;**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් මූලික උපාධියක්.

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියකට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.

   **හෝ**

   පිළිගත් වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය හා සම්බන්ධව ලබාගත් වරලත් සාමාජිකත්වය(ආශ්‍රිත) /සමාන වෘත්තීය සුදුසුකමක් .

   **සහ**

   ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 07ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්ද

2. ක්ෂේත්‍රයට අදාළව රජයේ දීපව්‍යාප්ත සේවාවන්වල හෝ සමාන සේවා තත්ත්වයේ III/II හෝ ඊට ඉහළ පන්තීන්ට අයත් නිලධරයෙකු වීම.

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ III/II වන පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 07ක පළපුරුද්ද

- ❖ ඉහත තනතුරු සඳහා සමතත්ත්වයේ ව්‍යාපෘතීන්වලදී ලබාගත් මූල්‍ය හා ගිණුම්කරණ ක්ෂේත්‍රයේ හා අභ්‍යන්තර විගණක ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

## 03. ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී - PS5 (තනතුරු - 01)

- **රැකියා විස්තරය**
  - ➢ ව්‍යාපෘතියට අදාළ සියලු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඉටුකිරීමෙහිලා ව්‍යාපෘති අධ්‍යක්ෂක හා ප්‍රසම්පාදන විශේෂඥ වෙත අවශ්‍ය සහය ලබාදීම.
  - ➢ ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම, ලංසු ලේඛන සැකසීම, සේවා හා නඩත්තු ගිවිසුම් සකස් කිරීම සඳහා ප්‍රසම්පාදන විශේෂඥ වෙත අවශ්‍ය සහය ලබාදීම.
  - ➢ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ක්‍රියාපටිපාටි හා රජයේ නීති හා රෙගුලාසිවලට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම.
  - ➢ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රගති වාර්තා හා ඇගයීම් වාර්තා සකස් කිරීම.
  - ➢ ව්‍යාපෘතියේ සියලුම ප්‍රසම්පාදනවලට අදාළව නිසි ලිපි ගොනු පද්ධතියක් පවත්වාගෙන යාම.
  - ➢ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික පහසුකම් භාවිතා කිරීම.
  - ➢ ව්‍යපෘතිය නියමිත කාලය තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමග කටයුතු කිරීම.
- **පළපුරුද්ද හා අවශ්‍ය සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සාර්ථකව සම්පූර්ණ කළ අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක්.

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියට සමාන සුදුසු ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සමාන සුදුසුකමක්.

   **හෝ**

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/සමාන වෘත්තීය සුදුසුකමක්.

   **හෝ**

   තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7ට (NVQ Level 7) නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සහ**

   අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුම තරමින් වසර 04 ක පළපුරුද්ද.

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6ට (NVQ Level 6) නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සහ**

   අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුම තරමින් වසර 09 ක පළපුරුද්ද.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5ට (NVQ Level 5) නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සහ**

   අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුම තරමින් වසර 14 ක පළපුරුද්ද.

- **පොදු කොන්දේසි**
  - ❖ වැටුප් හා අනෙකුත් දීමනා 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 01/2019 මත පදනම්ව ගෙවනු ලැබේ.
  - ❖ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළයුතු අවසාන දිනට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.
  - ❖ සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් දායක කරනු ලබන 8% සඳහා ව්‍යාපෘතිය විසින් 12% ක් දායක කරනු ලබන අතර, සේවක භාරකාර අරමුදල සඳහා 3% ක අතිරේක දායකත්වයක් සපයනු ඇත.
  - ❖ බඳවා ගැනීම වාර්ෂික කොන්ත්‍රාත් පදනම් මත සිදු කරනු ලබන අතර ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත හා වාර්ෂික කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සිදු කරනු ඇත.

සියලුම විස්තර සහිත අයදුම්පත්‍ර (සහතිකවල පිටපත් සහිතව) ව්‍යාපෘති අධ්‍යක්ෂක, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය, 10 වන මහල, " බී" පර්යන්තය, සුහුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2021 මැයි මස 31 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

**ලේකම්,**
**තාක්ෂණ අමාත්‍යාංශය.**